# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2010 අංක 6 දරන පුලතිසි දරුවෝ පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 පෙබරවාරි මස 09 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 පෙබරවාරි මස 12 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2010 අංක 6 දරන පුලතිසි දරුවෝ පදනම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 පෙබරවාරි මස 09 වන දින]

එල්. ඩී.—ඕ. (අයි. එන්. සී.) 5/2008.

## පුලතිසි දරුවෝ පදනම් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"පුලතිසි දරුවෝ පදනම් භාරය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වී ඇති රීතිවලට අනුකූලව එකී පදනම සම්බන්ධ සියලු කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පොළොන්නරුවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම්කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2010 අංක 6 දරන "පුලතිසි දරුවෝ පදනම් භාරය" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) පුලතිසි දරුවෝ පදනමේ දැනට සාමාජිකයන්ව සිටි හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවේ සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පුලතිසි දරුවෝ පදනම් භාරය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය. පුලතිසි දරුවෝ පදනම් භාරය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ළමා සහ තරුණ පිරිස් සඳහා අධ්‍යාපන කටයුතු සහ පෙර පුහුණු කටයුතු සංවිධානය කිරීම, පවත්වාගෙන යාම සහ වැඩිදියුණු කිරීම;

(ආ) තරුණ ශ්‍රමය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ගොවීන් දිරි ගැන්වීම හා තරුණ ගොවි සංවිධාන ඇති කිරීම;

(ඈ) තරුණයන්ට ප්‍රාග් වෘත්තීය අධ්‍යාපන පුහුණුව, ක්‍රීඩා ක්ෂේත්‍රයේ පුහුණුව හා නායකත්වය, පරිගණක, සන්නිවේදන, දමිළ, ඉංග්‍රීසි හා වෙනත් භාෂා පුහුණුවට ඉඩ ප්‍රස්ථා ලබා දීම;

(ඉ) සම්මන්ත්‍රණ, සාකච්ඡා හා වැඩමුළු පැවැත්වීම මගින් ජාතික සමගිය වැඩිදියුණු කිරීමේ කාර්යයෙහි නියැලී සිටින පුද්ගලයන් පුහුණු කිරීම;

(ඊ) සම්මාන, ත්‍යාග, ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මගින් ජාතික සමගිය කෙරෙහි දායකත්වය දුන් විශිෂ්ට පුද්ගලයන් අනුස්මරණය කිරීම හා ගෞරව කිරීම;

(උ) පුස්තකාල, ලේඛන ආරක්ෂකාගාර සහ ශ්‍රී ලංකාවේ සියලු ජන කොටස්වල සංස්කෘතික උරුමය ආරක්ෂා කිරීම සඳහා ඒවා සුරක්ෂිත කරන මධ්‍යස්ථාන බිහි කර පවත්වාගෙන යාම;

(ඌ) ළමයින්ගේ, කාන්තාවන්ගේ සහ අනාථ දරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ශුභසාධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම;

(එ) ශ්‍රී ලංකාවේ සහ විදෙස්වල පර්යේෂණයන් සහ අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා සිසුන්ට ශිෂ්‍යත්ව, ණය, අත්තිකාරම් සහ ආධාර ප්‍රදානය කිරීම මගින්, ඔවුන්ට සහන සැලසීම;

(ඒ) අනාථ, ආබාධිත, මහළු හා ගිලන් සහ අවතැන් වූ පුද්ගලයන්ගේ සුභසාධනය, පුහුණුව සහ පුනරුත්ථාපනය සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම;

(ඔ) ජාතිය සහ ආගම ගැන නොතකා ජනතාව තුළ අන්‍යොන්‍ය අවබෝධය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම; සහ

(ඕ) පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා වූ ව්‍යාපෘති ආරම්භ කොට පවත්වා ගෙන යාම.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම් වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙළින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, පරිත්‍යාග සහ රික්ථවරණ භාර ගැනීම;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇතිකිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛන ප්‍රසිද්ධ කිරීම හෝ ප්‍රසිද්ධ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඊ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

**5.** (1) සංස්ථාවේ සභාපති, උප සභාපති, ගරු ලේකම්, ගරු උප ලේකම්, ගරු භාණ්ඩාගාරික, ගරු උප භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන වෙනත් සාමාජිකයන් නව දෙනකුගෙන් සමන්විත වන (මෙහි මින්මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් විසින් 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම පාලක සභාව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී, පදනමේ පාලක සභාවේ සාමාජිකත්වය දරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(3) මේ පනත යටතේ සභාපතිවරයකු පත් කරනු ලබන තෙක් මෛත්‍රීපාල සිරිසේන මහතා සංස්ථාවේ ප්‍රථම පාලක සභාවේ සභාපති විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ සාමාජිකයන් ඇතුළුකර ගැනීම, ඔවුන් ඉල්ලා අස්වීම සහ සාමාජිකත්වයෙන් නෙරපීම, සංස්ථාවේ ධුර දරන්නන්ගේ චර්යාව සහ කාර්ය, සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, සංස්ථාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ තත්කාර්යය සඳහා සති දෙකක් කල් දී කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක දී

ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එවැනි රීතියක් සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් එය වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පදනමේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය හා පදනම වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

8. (1) (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් කියනු ලබන සහ සඳහන් කරනු ලබන) ස්වකීය වූ අරමුදලක් සංස්ථාවට තිබිය යුත්තේ ය. සංස්ථාවේ අරමුදල.

(2) පහත දැක්වෙන මුදල් අරමුදලට බැර කළ යුත්තේ ය:—

(අ) මේ පනත යටතේ සිය බලතල. කර්තව්‍යයන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ ක්‍රියාවේ යෙදවීමේ දී සංස්ථාවට ලැබිය හැකි සියලුම මුදල්; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ මූලයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදානයන් වශයෙන් සංස්ථාවට ලැබිය හැකි සියලුම මුදල්.

9. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය:— විගණනය හා ගිණුම්.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය;

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(ඈ) මෙම වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තීයෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සභාපතිවරයා ද ලේකම් හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු හෝ පාලක සභාව විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

නඩු කටයුතු වලින් මුක්ත බව.

11. මේ පනතින් හෝ ඒ යටතේ හෝ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

12. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, 6 වන වගන්තිය යටතේ සාදන ලද රීති අනුව යම් ආදායම් හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

13. ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.